අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2013 අගෝස්තු

# General Certificate of Education (Adv. Level) Examination, August 2013

## ආර්ථික විද්‍යාව - II

## Economics - II

විභාග අංකය : ..........................

පැය තුනයි / Three hours

උපදෙස් :

- "අ" උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද "ආ" උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පම
පිළිතුරු සපයන්න.
- ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.

### "අ" උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)

01. i) "ප්‍රාග්ධනය" හා "මානව ප්‍රාග්ධනය" අතර වෙනස කුමක් ද? (ලකුණු 04

ii) විශේෂීකරණය හා ශ්‍රම විභජනය නගාලීම සඳහා මුදල් උපකාරී වන්නේ කුමන ආකාරයෙන් ද? (ලකුණු 04

iii) හිඟකම පිළිබඳ ගැටලුවට මුහුණ දෙමින් ආර්ථිකය මෙහෙයවීමේ දී වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක් හා විධානගත ආර්ථික පද්ධතියක් එකිනෙකින් වෙනස් වන්නේ කෙසේ දැ යි පැහැදිලි කරන්න. (ලකුණු 04

iv) ආර්ථිකයේ සම්පත් කාර්යක්ෂම ව උපයෝජනය වේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි කවරේ ද? (ලකුණු 04

v) ආර්ථිකයේ සූක්ෂ්ම හා සාර්ව ආර්ථික ගැටලු පැහැදිලි කිරීම සඳහා නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය යොදා ගත හැක්කේ කෙසේ ද? (ලකුණු 04

02. i) සංඥා සැපයීමෙහි හා සලාකනයෙහි ලා වෙළඳපොළ මිල විසින් ඉටුකරනු ලබන කාර්යභාරය විස්තර කරන්න (ලකුණු 04

ii) කිසියම් කාර්මික භාණ්ඩයක සැපයුම තීරණය කරන මිල නොවන ප්‍රධාන සාධක හතරක් නම් කරන්න. (ලකුණු 04

iii) කිසියම් භාණ්ඩයක් සඳහා වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් ලේඛනවලට අදාළ දත්ත සමහරක් පහත දී ඇත.

| මිල (රු) | ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය ($Q_d$) | සැපයුම් කරනු ලබන ප්‍රමාණය ($Q_s$) |
|---|---|---|
| 4 | 84 | 12 |
| 8 | 68 | 44 |

ඉල්ලුම් හා සැපයුම් වක්‍ර දෙක ම රේඛීය වක්‍රවේ යයි උපකල්පනය කොට, වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර සඳහා අද
සමීකරණ ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 04

iv) ඉල්ලුම් හා සැපයුම් සමීකරණ උපයෝගි කරගනිමින්, සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 04

v) රජය භාණ්ඩ ඒකකයක් මත රු. 3 ක විශේෂිත බද්දක් පනවන්නේ යැ'යි උපකල්පනය කරමින්, බද්ද පැනවීමෙන් පසු නිෂ්පාදකයන්ට ලැබුණු මිල හා රජයේ බදු අයභාරය ගණනය කරන්න. (ලකුණු 04

03. i) හීනවන ඵලදා නීතිය හා පරිමාණානුකූල ඵල නීතිය නිෂ්පාදන ආයතනයක නිෂ්පාදන පිරිවැය කෙරෙහි බලපාන්නේ කෙසේ ද
පැහැදිලි කරන්න. (ලකුණු 04

ii) ආයතනයක ආන්තික පිරිවැය වක්‍රය හා එම ආයතනය අයත් කර්මාන්තයේ සැපයුම් වක්‍රය අතර සබඳතාවක් පවතින්නේ ද යන්න සාකච්ඡා කරන්න.

iii) පූර්ණ තරඟකාරී ආයතනයක් තිරස් ඉල්ලුම් වක්‍රයකට මුහුණ දෙන අතර, එම කර්මාන්තය පහළට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයකට මුහුණ දෙන්නේ මන් දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 04

iv) කෙටි කාලයෙහි නිෂ්පාදනයෙහි නිරත ව සිටින ආයතනයක මුළු අයභාරය රු. මිලියන 100 ක් බවත් මුළු පිරිවැය රු. මිලියන 120 ක් බවත්, මුළු ස්ථාවර පිරිවැය රු. මිලියන 40 ක් බවත් වාර්තා කරයි. මෙම තත්ත්වය යටතේ එම ආයතනය තවදුරටත් නිෂ්පාදනයේ රැඳී සිටිය යුතු ද? එසේ නම් ඒ ඇයි. (ලකුණු 04 යි)

v) සෑම වෙළෙඳපොළ ව්‍යුහයක ම ලාභ උපරිමනය සඳහා ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමාන වීම අත්‍යවශ්‍ය වන්නේ ඇයි? නිෂ්පාදන ආයතනය පූර්ණ තරගකාරී ආයතනයක් වේ නම්, ආන්තික අයභාරය = ආන්තික පිරිවැය (MR = MC) කොන්දේසිය යටතේ, ආන්තික අයභාරය (MR) වෙනුවට මිල (p) ආදේශ කළ හැක්කේ කුමක් නිසා දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

04. i) තොග වෙනස්වීම් යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? තොග වෙනස්වීම් ආයෝජන වියදමෙහි සංරචකයක් ලෙස ඇතුළත් කරන්නේ ඇයි ? (ලකුණු 04 යි)

ii) රජය විසින් කරනු ලබන පොලී ගෙවීම් පෞද්ගලික ආදායමේ සංරචකයක් වශයෙන් සලකන නමුදු, එය ජාතික ආදායමේ සංරචකයක් වශයෙන් නොසලකන්නේ මන් නිසා ද? (ලකුණු 04 යි)

iii) "යම් රටක් තම ජාතික ආදායමට වඩා වැඩි ප්‍රමාණයක් වියදම් කරන්නේ නම්, එම රටෙහි වෙළෙඳ ශේෂයෙහි හිඟයක් පැවැතිය යුතු ය." මෙම ප්‍රකාශය පිළිබඳ ව අදහස් දක්වන්න. (ලකුණු 04 යි)

iv) යම් ආර්ථිකයක් පිළිබඳ ව පහත තොරතුරු ඔබට දී ඇත. (සියලු ම අගයන් රු. මිලියනවලිනි.)

| | | |
|---|---|---|
| ජාතික ආදායම (Y) | = | 5 200 |
| වැය කළ හැකි ආදායම($Y_d$) | = | 4 400 |
| පරිභෝජනය (C) | = | 4 100 |
| අයවැය හිඟය (BD) | = | 150 |
| වෙළෙඳ ශේෂයේ හිඟය | = | 110 |

ඉහත තොරතුරු උපයෝගි කර ගනිමින් පහත දෑ ගණනය කරන්න.

(අ) රජයේ මිලදී ගැනීම් (G)
(ආ) ඉතුරුම් (S)
(ඇ) ආයොජන (I) (ලකුණු 04 යි)

v) "සැඟවුණු ආර්ථිකය (underground economy)" යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? එහි විශාලත්වය අඩු කළ හැක්කේ කෙසේ ද?

05. i) "ආයෝජන ගුණකය" යන්නෙහි අර්ථය කෙටියෙන් පැහැදිලි කරන්න.

ii) "උද්ධමන පරතරය (inflationary gap)" හා "ප්‍රතිගමනාත්මක පරතරය (recessionary gap)" (අවධමන පරතරය) අතර වෙනස පැහැදිලි කරන්න.

iii) "ආදායම තීරණය වීමේ සරල ආදායම්-වියදම් ආදර්ශයට අනුව ආර්ථිකයක් එක්කෝ උද්ධමනය හෝ සේවා විශුක්තිය හෝ සහිත ව, නැත්නම් මේ දෙකෙන් එකක්වත් නොමැතිව සමතුලිතතාවයේ පැවැතිය හැකි ය." සුදුසු රූප සටහන් යොදා ගනිමින් මෙම අදහස පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

iv) දෙන ලද කාලසීමාවක දී කිසියම් ආවෘත ආර්ථිකයක ආයෝජනය 100 ක් බවත්, රජයේ මිල දී ගැනීම් 75 ක් බවත්, ශුද්ධ බදු 100 ක් බවත්, පරිභෝජනය (C) = 25 + 0.8 $Y_d$ යන ශ්‍රිතයෙන් දී ඇති බවත් සලකන්න මෙහි $Y_d$ යනු වැය කළ හැකි ආදායම වේ.

(අ) රජයේ වියදම් ගුණකය හා බදු ගුණකය ගණනය කරන්න.

(ආ) මෙම ආර්ථිකයේ පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටම 1000 යයි සලකන්න. පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටම කරා ළඟාවීමට රාජ්‍ය මිලදී ගැනීම් කෙතරම් ප්‍රමාණයකින් ඉහළ යා යුතු ද? එයට විකල්ප ක්‍රියාමාර්ගයක් වශයෙන් පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටම කරා ළඟාවීමට බදු ආදායම පහළ හෙළන්නේ නම්, බදු කොපමණ ප්‍රමාණයකින් අඩු කිරීම ප්‍රමාණවත් වේ ද? (ලකුණු 04 යි)

www.SamithAlwis.wordpress.com

## "ආ" උප කොටස

(මෙම කොටසෙන් ද අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)

06\. i) " අධිබලැති මුදල් "යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද? මහ බැංකුවක් අධිබලැති මුදල් මවනු ලබන්නේ කෙසේ දැ'යි කෙටියෙ පැහැදිලි කරන්න. (ලකුණු 04

ii) ආර්ථිකයක මුදල් සැපයුම නිර්ණය කරනු ලබන සාධක මොනවා ද?

iii) ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය සමන්විත වී ඇති ප්‍රධාන මූල්‍ය ආයතන කාණ්ඩ (categories) කවරේ ද? (ලකුණු 04

iv) යම් කල්පිත ආර්ථිකයක මුදල් සැපයුම (M) රු. බිලියන 1 200 ක් ද මුළු තැන්පතු (D) රු. බිලියන 800 ක් ද, අවශ්‍ය සංචි - තැන්පතු අනුපාතය 10% ක් ද වේ බැංකු සතුව අතිරික්ත සංචිත නොපවතින බව ද සලකන්න.

(අ) මෙම ආර්ථිකය සඳහා වන මුදල් ගුණකයේ අගය කුමක් ද?

(ආ) මහ බැංකුව රු. බිලියන 3 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් වාණිජ බැංකු වෙතින් මිලදී ගන්නේ නම්, මුළු මුදල් සැපයුම උපරි වශයෙන් වෙනස් විය හැක්කේ කොපමණ ප්‍රමාණයකින් ද? (ලකුණු 04

v) "මුදල් ප්‍රමාණවාදය" පිළිබඳ කෙටි විග්‍රහයක් කරන්න. ඒ හා බැඳුණු උපකල්පන හඳුනා ගන්න. (ලකුණු 04

07\. i) සම්පත් කාර්යක්ෂමව බෙදාහැරීමෙහි ලා වෙළෙඳපොළ අසමත් විය හැක්කේ කුමක් නිසා ද? (ලකුණු 04

ii) සුදුසු රූප සටහන් ආධාරයෙන් ශ්‍රී ලංකාවේ මහාමාර්ගවල සාමාජිය වශයෙන් හිතකර ප්‍රමාණයට වඩා වැඩි මෝටෝරථ සංඛ්‍යාව දක්නට ලැබෙන්නේ මන් දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 04

iii) වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ රජය සතුව නොවැළැක්විය හැකි කාර්යභාරයක් පවතින්නේ ඇයි ? (ලකුණු 04

iv) යහපත් බදු ක්‍රමයක් සතුව තිබිය යුතු ගුණාංග සඳහන් කරන්න. (ලකුණු 04

v) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති මගින් ආදායම් අසමානතාව අඩු කළ හැකි ආකාර පැහැදිලි කරන්න. (ලකුණු 04

08\. i) සංඛ්‍යාත්මක උදාහරණයක් සපයමින්, නිෂ්පාදනයේ නිරපේක්ෂ වාසි හා සාපේක්ෂ වාසි අතර වෙනස පහදන්න. (ලකුණු 04

ii) රටවල් අතර වෙළෙඳ රටා තීරණය කිරීමට හේතු විය හැකි ආර්ථික සාධක පැහැදිලි කරන්න. (ලකුණු 04

iii) ජාත්‍යන්තර වෙළෙඳාමට ඇති බාධක ඉවත්කරලීමෙහි ලා යොදා ගන්නා ගෝලීය හා කලාපීය ප්‍රවේශ එකිනෙක සංසන්දනය කො ඒවා අතර වෙනස්කම් දක්වන්න. (ලකුණු 04

iv) නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයක වාසි හා අවාසි මොනවා ද? (ලකුණු 04

v) ශ්‍රී ලංකාවේ ආනයන වියදම්වල හා අපනයන ඉපැයීම්වල මෑතකාලීන ප්‍රවණතා පරීක්ෂා කරන්න. වර්තමානයේ ශ්‍රී ලංකාව මුහුණ පා ඇති විශාල වෙළෙඳ ශේෂ හිඟයට බලපා ඇති හේතු කවරේ ද? (ලකුණු 04

09\. i) ආර්ථික වර්ධනය හා සංවර්ධනය අතර වෙනස විචාරාත්මකව පරීක්ෂා කරන්න. (ලකුණු 04

ii) රටක ඵලදායිතා මට්ටම තීරණය කරන ප්‍රධාන සාධක සඳහන් කරන්න. (ලකුණු 04

iii) "ශ්‍රී ලංකාව මානව සංවර්ධනය සම්බන්ධයෙන් ජාතික මට්ටමෙන් ලබා ගෙන ඇති ජයග්‍රහණ සිත් ඇදගන්නාසුලු වුව ද, ප්‍රාදේශී වශයෙන් හා ආංශික වශයෙන් මානව සංවර්ධනයේ අසමානතා තවදුරටත් දක්නට ලැබේ." පැහැදිලි කරන්න. (ලකුණු 04

iv) ශ්‍රී ලංකාවේ ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තියේ කැපීපෙනෙන ලක්ෂණ හඳුනා ගන්න. ඒවායේ ආර්ථික ඇඟැවීම් මොනවා ද?

10\. i) ශ්‍රී ලංකාවේ ඉතුරුම් - ආයෝජන පරතරයේ මෑතකාලීන උපනති පරීක්ෂා කරන්න. (ලකුණු 04

ii) වර්ෂ 2016 ට ප්‍රථම එක්සත් ජනපද ඩොලර් 4000 ඉක්ම වූ ඒකපුද්ගල ආදායම් ඉලක්කයක් අත්කර ගැනීමට අපේක්ෂා ක ශ්‍රී ලංකා ආර්ථිකය සම්බන්ධයෙන්, දැනට පවතින සෘණ ඉතුරුම් - ආයෝජන පරතරය ගම්‍ය කරන දෑ කවරේ ද? (ලකුණු 06

iii) ශ්‍රී ලංකාව ආසියාවේ ප්‍රධාන සංචාරක මධ්‍යස්ථානයක් බවට පත් කර ගැනීමේ දී මෙරට සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග කවරේ ද? (ලකුණු 05

iv) දිළිඳු රටවල ස්ථාවර හා දිගුකාලීන ආර්ථික වර්ධනයක් අත්කර ගැනීමේ දී, යහපාලනය පවත්වා ගැනීම කෙතෙක් දුරට වැද වන්නේ ද? (ලකුණු 05

* * *

www.SamthAlwis.wordpress.com

# A/L 2021 - Home Visiting

Colombo & Gampaha

The Ideal class for your eminent university dream

Econ අපි

සමිත් අල්විස්

Econ (Sp) - Kelaniya, HRM - OU

☎ 071-7556342

ලෝකයේ Cental Bank

www.SamithAlwis.wordpress.com

සරසවියට shortcut එකක්